(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 4(7).]**

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 අගෝස්තු 11 බදාදා**

---

**2021 සැප්තැම්බර් 06 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

199/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම් ;

(iii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

945/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(ii) එම අරමුදල පාලනය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iii) එම අරමුදල පාලනය කිරීම සඳහා රජයේ නිලධාරියකු පත් කර තිබේද;

(iv) එසේ නම්, එම නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අරමුදලේ මේ වනවිට පවතින ශේෂය කොපමණද;

(ii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට ඉහත සඳහන් අරමුදලෙන් ලබා දී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඒ සඳහා වියදම් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

282/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 - 2014 වකවානුව තුළ ශ්‍රී ලංකා යුද හමුදාවට කලාකරුවන් පිරිසක් විශේෂ පදනමක් මත බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, බඳවාගන්නා ලද දිනය හා තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්වෙච්ඡා සහ ස්ථිර යන බලසේනා අතරින් එම කලාකරුවන් බඳවාගෙන ඇති බලසේනාව කවරේද;

(ii) ඔවුන්ට හමුදා පුහුණුවක් ලබා දී තිබේ නම්, පුහුණු කාලය සහ පුහුණු කඳවුරේ නම කවරේද;

(iii) පුහුණුවෙන් පසු එම එක් එක් කලාකරුවාට පවරන ලද රාජකාරි, අනුයුක්ත කරන ලද රෙජිමේන්තුව, ගෙවන ලද වැටුප්, දීමනා හා වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත බඳවා ගැනීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට සම්බන්ධ පාර්ශ්වයන්ට එරෙහිව ගන්නා ලද හා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

464/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 දී සාලාව යුධ හමුදා කඳවුරේ සිදු වූ පිපිරීමෙන් විනාශ වූ අවි ආයුධවල මූල්‍යමය වටිනාකම;

(ii) එහිදී හමුදා කඳවුරට සිදු වූ හානියේ මූල්‍යමය වටිනාකම;

(iii) එම පිපිරීමෙන් හමුදා කඳවුර අවට පිහිටි වෙළඳසැල් සහ නිවාසවලට සිදු වූ හානියේ මූල්‍යමය වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පිපිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණය අනුව ඉහත සඳහන් පිපිරීමට හේතු කවරේද;

(iii) ඉහත පිපිරීමට අදාළ වැරදිකරුවන් අනාවරණය වී තිබේ නම්, ඔවුන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සිට මේ වනතෙක් හඳුනාගෙන ඇති, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති අධි අවදානම් නිවාස සංඛ්‍යාව;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේදී ප්‍රමාදයක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

755/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ—

(i) පදිංචිව සිටින නිවාස අවශ්‍යතා සහිත පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) දිස්ත්‍රික්කයේ පෞද්ගලික ඉඩම්වල අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව;

(iii) ආදර්ශ ගම්මාන වශයෙන් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

85/2020

ගරු හේෂා විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) දීර්ඝ කාලයක් ජනතාව පදිංචි වී සිටින වලව කලාපයේ සමහර ඉඩම් සඳහා හිමිකම්පත් ලබා දීමේදී එම ඉඩම් සඳහා තක්සේරු කර ඇති මුදල අසාධාරණ බව පිළිගන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) මහවැලි කලාපවල දීර්ඝ කාලයක් පදිංචි වී සිටින ජනතාවගේ ඉඩම් සඳහා සාධාරණ බදු මුදලක් මත හිමිකම්පත් ලබා දීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතනවල ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමක පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

671/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ඉදිකිරීම් ආරම්භ කරන ලද බිංගිරිය, කිණියම වාරි ව්‍යාපෘතියේ යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා ගත වන කාලය කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය මඟින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1203/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ—

(i) මහා වාරිමාර්ග යටතේ වැව් 14ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 126,242ක් පමණ වන බවත්;

(ii) මධ්‍ය වාරිමාර්ග යටතේ වැව් 83ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 29,775ක් පමණ වන බවත්;

(iii) පළාත් වාරිමාර්ග යටතේ වැව් 3,019ක් ඇති අතර එහි වගා වපසරිය අක්කර 106,185ක් පමණ වන බවත්;

(iv) ඉහත වැව් බොහොමයක මේ වනවිට රොන් මඩ තැන්පත් වී ඇති අතර සැල්වීනියා හා ජපන් ජබර ආදී විවිධ ජලජ පැළෑටි වැවී එම වැව් ගොඩවීමෙන් ඒවායේ ජල ධාරිතාවය අඩු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(ii) සැල්වීනියා හා ජපන් ජබර උපයෝගී කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

493/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයේ, මධ්‍යම රජයට, පළාත් සභාවට සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල දිග ප්‍රමාණය කිලෝ මීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත මාර්ග අතරින් මේ වනවිට අබලන් වී ඇති මාර්ගවල දිග ප්‍රමාණය ඉහත සඳහන් එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බණ්ඩාරවෙල මැතිවරණ කොට්ඨාසයට අයත් සියලුම මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

465/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018 හා 2019 දී පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේදී මුද්‍රණය කරන ලද පෙළපොත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එවකට අධ්‍යාපන අමාත්‍යවරයාගේ වර්ණ ඡායාරූපයක් එම පෙළපොත්වලට ඇතුළත් කර තිබුණේද;

(iv) එසේ නම්, එම ඡායාරූපය එම පෙළපොත්වල මුද්‍රණය කර පළ කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

803/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි / වට්ටක්කච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

806/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධි සේවක පදනම මත දිවයින පුරා පාසල්වල පත්වීම් ලබා දී ඇති විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත තුළ සේවයේ යෙදී සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් විදුහල්පතිවරුන්ට—

(i) පත්වීම් ලබා දෙන ලද දිනය;

(ii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා නොදීමට හේතු;

(iii) වැටුප් වැඩිවීම්, උසස්වීම් සහ ස්ථාන මාරු ලබා දෙනු ලබන දින වකවානු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම විදුහල්පතිවරුන්ව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය නොකිරීමට හේතු;

(ii) ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන දින වකවානු;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

510/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ වනතෙක් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කටුවැල්බටු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද කටුවැල්බටු ප්‍රමාණය කොපමණද;

(iv) කටුවැල්බටු වගාව ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාධු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

825/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සියඹලන්ගමුව ප්‍රදේශයේ, වකුගඩු රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා රෝහලක් ඉදිකර ඇති බවත්;

(ii) ගල්ගමුව හා පොල්පිතිගම ප්‍රදේශවල ජීවත්වන විශාල පිරිසක් වකුගඩු රෝගයට ගොදුරු වී ඇති බවත්;

(iii) එහෙත්, ඉහත සඳහන් රෝහල වසර 03ට අධික කාලයක් තිස්සේ වසා දමා ඇති බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) ඉහත සඳහන් රෝහල කඩිනමින් විවෘත කර වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1080/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 05ක කාලය තුළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ මියගිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) වකුගඩු රෝගය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය විසින් ක්‍රියාත්මක කරන ලද, වකුගඩු රෝගීන් සඳහා මාසිකව අධාර මුදල් ලබා දීමේ වැඩසටහනට අලුතින් හඳුනාගනු ලැබූ වකුගඩු රෝගීන් ඇතුළත් කර නොමැති බවත්;

(ii) අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක නොවන බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (i) සහ (ii) හි සඳහන් වැඩසටහන් විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1200/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර මහ රෝහලේ —

(i) අධ්‍යක්ෂවරයා පත් කරන ලද පදනම කවරේද;

(ii) මේ වනවිට සේවය කරනු ලබන වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) වෛද්‍ය නිලධාරි තනතුරෙහි මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට සේවය කරනු ලබන හෙද කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනවිට පවතින හෙද පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජපාන අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ අනුරාධපුර මහ රෝහලේ ඉදිකිරීමට සැලසුම් කර තිබූ හෘද රෝග ශල්‍යාගාරයේ;

(ii) ළමා හා මාතෘ සායන සඳහා වන ගොඩනැගිලි සංකීර්ණයේ;

(iii) අංග සම්පූර්ණ හදිසි ප්‍රතිකාර ඒකකයේ;

වර්තමාන තත්ත්වය කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝව සතු මේ වනවිට ධාවනයේ යෙදවීමට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ඩිපෝවල සේවය කරනු ලබන මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා හා එම ඩිපෝවල පවතින බස්රථ ඇණි වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

971/2020

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සහ උප ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ නම් කවරේද;

(iii) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත එක් එක් ඩිපෝවේ සහ උප ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය උප ඩිපෝව, 2001 වර්ෂයේදී උප ඩිපෝවක් බවට පත් කළ අතර එම ඩිපෝව මේ දක්වා උප ඩිපෝවක් ලෙසම පවතින බව එතුමා දන්නෙහිද?

(ii) එම උප ඩිපෝව, ප්‍රධාන ඩිපෝවක් බවට උසස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

67/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපද්‍රව්‍ය කළමනාකරණය යන විෂයය, පළාත් සභා යටතට ගැනෙන විෂයයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට මේ වනතෙක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභාවල නම් කවරේද;

(ii) එවැනි විශේෂිත ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභාවල නම් කවරේද;

(iii) එවැනි ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභා සඳහා සුවිශේෂී ආයතනයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

80/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රත්නපුර දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලැබූ සතිපොළ සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංවර්ධනය කරනු ලැබූ සතිපොළවල නම් කවරේද;

(iii) එම එක් එක් සතිපොළ සංවර්ධනය කිරීම සඳහා වියදම් කරනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් සතිපොළ සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයාගේ නම සහ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි - මිනිස් ගැටුමෙන් —

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

76/2020

ගරු හේෂා විතානගේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වී ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ලියාපදිංචි වීම සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

242/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන අමතර කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන අමතර කොටස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එකී වාහන අමතර කොටස් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන අමතර කොටස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

832/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ලද පළමු වර්ෂය කවරේද;

(ii) එම වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති මුළු සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iii) 2014.12.31 දින වනවිට ශ්‍රී ලංකාවට ලැබී තිබූ මුළු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2020 දක්වා ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල වටිනාකම කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් ආයෝජන වටිනාකම එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1365/2020

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සමන් කැකුල", ඇඹලව, දෙමටමළුව, කුරුණෑගල යන ලිපිනයේ පවත්වාගෙන යන ලද ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මනස්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් යන මූල්‍ය ආයතනයේ කටයුතු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහනම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය තහනම් කිරීමට හේතු;

(ii) එහි ප්‍රධානියාගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම්;

(iii) එම ආයතනයේ ශාඛා තිබේ නම්, එවායේ නම්;

(iv) එම ආයතනය සහ එහි එක් එක් ශාඛාව සතු වත්කම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මුදල් සහ පොලිය අහිමි වීමෙන් එම ආයතනයේ තැන්පත්කරුවන් දැඩි පීඩනයකට පත්ව සිටින බවත් එතුමා දන්නෙහිද?

(ඈ) (i) තැන්පත්කරුවන්ගේ නම් සහ තැන්පත් මුදල වෙන් වෙන් වශයෙන්;

(ii) තැන්පත්කරුවන්ගේ මුදල් සහ පොලී නැවත ලබා දීමට ගෙන ඇති පියවර හා ඒ සඳහා ගතවන කාලය;

(iii) මේ සම්බන්ධ වැරදිකරුවන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2264/2021

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය, ගන්නොරුව ප්‍රදේශයේ මහවැලි ගඟ හරහා ඉදිකර ඇති සංගිලි පාලම අසල පේරාදෙණිය උද්භිද උද්‍යානයට ප්‍රතිවිරුද්ධ දිශාවට මුහුණලා මහවැලි ගඟ ආක්‍රමණය කර අනවසර හෝටලයක් ඉදිකරමින් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර අනිවත්ත ප්‍රදේශයේ දොඩංවල නව පාලමට වම්පස පිහිටා ඇති (අනිවත්ත සිට හල්ඔළුව මාර්ගයට පිවිසෙන විට) මහවැලි ගඟ රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් විශාල සංඛ්‍යාවක් සිදු කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) අනවසර ඉදිකිරීම් වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

347/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති, ඉඩම් සඳහා ඔප්පු නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

822/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින විශාල පිරිසකගේ ඉඩම් සඳහා ඔප්පු නොමැති බව පිළිගන්නේද;

(ii) එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුදෙනියාය ගම්මානයේ ජනතාව මේ වනවිට අවුරුදු 50කට ආසන්න කාලයක් එහි පදිංචිව සිටින බවත්;

(ii) ඔවුන්ගේ ඉඩම් සඳහා මේ වනතෙක් ඔප්පු ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) ඉරුදෙනියාය ගම්මානයේ පදිංචිව සිටින ජනතාවගේ ඉඩම් සඳහා ඔප්පු ලබා දෙනු ලබන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය සපයන වැව්වල ජලයේ ගුණාත්මකභාවය පිරිහී ඇති බවත්;

(ii) E-coli ඇතුළු විෂබීජ අඩංගු වීම හේතුවෙන් එම ජලය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පානීය ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන වැව්වල නම් කවරේද;

(ii) එම වැව්වල ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1108/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලගෙදර, මාවතගම (මල්ලවපිටිය) ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම් ලබා දීමට අපේක්ෂා කරනු ලබන ආයතන හා නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්වය කවරේද;

(v) ව්‍යාපෘතියේ වැඩ අවසන් කර එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

308/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ගෙවීමට තිබෙන රාජ්‍ය ආයතන, මණ්ඩල, සංස්ථා හා දෙපාර්තමේන්තු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එක් එක් රාජ්‍ය බැංකුව සඳහා ගෙවීමට ඇති ණය මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

754/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

321/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ටේබල් ටෙනිස් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) අංක (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ටේබල් ටෙනිස් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටේබල් ටෙනිස් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ටේබල් ටෙනිස් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1829/2021

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු ප්‍රමාදවීම මත නඩු ගොඩගැසීම හේතුවෙන් මහජනතාව පීඩාවට පත් වන බව පිළිගන්නේද;

(ii) උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන නඩු සඳහා උපදෙස් ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 සැප්තැම්බර් 21 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

72/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නියෝජිතයාගේ නම හා අදාළ පළාත් පාලන ආයතනයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් වැඩමුළුව පැවති රට, නගරය හා කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වැඩමුළුවට සහභාගි වීම සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කළ පළාත් පාලන ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

176/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාලු පාරේ කොළඹ සිට මොරටුව දක්වා පවතින අධික මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් සිදු කරනු ලබන මුහුදුබඩ මාර්ගයේ (Marine Drive) ඉදිකිරීම් කටයුතු, කොල්ලුපිටියේ සිට දෙහිවල - වාසල පාර දක්වා පමණක් සිදු කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමී බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන්නන් සඳහා ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ලබා දීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, එම මුදල් ලබා දීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

178/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල වර්ග කිරීම අනුව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පිහිටි තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ඉඩම් සහ ගොඩනැගිලි සහිත තැපැල් සහ උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරදිපුරම්, පුන්නෛනීරාවි, පල්ලික්කුඩා ප්‍රදේශයන්හි උප තැපැල් කාර්යාල ඉදිකිරීමට අවශ්‍ය බව දන්නේද;

(ii) එසේ නම්, 2016.09.05 දින එවකට අමාත්‍යවරයාට මවිසින් යොමු කළ ලිපිය අනුව, තැපැල්පතිවරයා වෙත යොමු කරන ලද අංක PPS&MR/HR/09-182 හා 2016.09.09 දිනැති ලිපියට පියවරක් නොගත්තේ මන්ද;

(iii) කල්මඩුනගර්, තිරුනගර්, කෝනාවිල්, කරඩිබෝක්කු, තිරුවෛයාරු, අම්බාල්කුලම්, මුරසුමෝට්ටෛ, දරුමපුරම්, කණ්ඩාවලෙ, පුළියම්පොක්කනෛ, කුංජුපරන්දන්, සිවනගර්, මුහමාලෛ, ඉයක්කච්චි, කිළාලි, එලුදුමට්ටුවාල්, සෝරන්පට්ටු, තට්ටුවන්කොට්ටි, සුණ්ඩික්කුළම්, සෙට්ටියකුරුච්චි, ඉරනෛතීවු, ගෞදාරිමුනෛ, පල්ලවරායන්කට්ටු, නල්ලූර්, කිරාංජි හා වේරවිල් යන උප තැපැල් කාර්යාලවලට ස්ථිර ගොඩනැගිලි පහසුකම් ලබාදෙන දිනය කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ, ප්‍රධාන තැපැල් කාර්යාල හතර වන කිළිනොච්චි, පරන්තන්, පච්චිලෛපල්ලි හා පූනගරි නවීන පරිගණක පහසුකම් සහිතව ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

293/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

313/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් ද්‍රෝණිය අසළ විශාල ඛනිජ තෙල් නිධියක් පවතින බවට සනාථ කර ගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම නිධිය සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පර්යේෂණ කිරීම සඳහා භාර දෙන ලද ආයතනවල හා සංවිධානවල නම් කවරේද;

(iv) එම පර්යේෂණ කිරීම සඳහා මේ වනතෙක් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ඛනිජ තෙල් සහ ගෑස් නිධියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් මේ වනතෙක් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

467/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට එක් වර්ෂයකට ආනයනය කරනු ලබන රසායනික පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) වගාබිම් හෙක්ටයාර් එකක් සඳහා යොදනු ලබන රසායනික පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රසායනික පොහොර යෙදීම හේතුවෙන් පසට සිදු වන හානිය සම්බන්ධයෙන් පර්යේෂණ කර තිබේද;

(ii) එම හානිය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

605/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව 2020/2021 මහ කන්නයේ වගා කටයුතු සඳහා රසායනික පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වගා කරනු ලබන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iii) වී වගා කරන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, වී වගා කරනු ලබන එක් අක්කරයක් සඳහා එක් එක් පොහොර වර්ගවලින් ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අතිරේක බෝග වගා කිරීම සඳහා අක්කරයකට ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

630/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(ii) එම කුඹුරු ඉඩම් අතරින් මේ වනවිට වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ පුරන් වී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරන් වී ඇති කුඹුරු ඉඩම් නැවත ඇස්වැද්දීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

836/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— (1)

(අ) (i) කොළඹ 03, ගාලු පාර, 282/සී දරන ලිපිනයේ පදිංචි කස්තුරිආරච්චිගේ යසසිරි හා ජේ.ජී.අයි. උදයංගනී කස්තුරිආරච්චි යන අයට එරෙහිව රුපියල් 201,337.50/- ක පාරිතෝෂික මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති අංක 90661 දරන නඩුවට අදාළව 2019.08.01 දින අධිකරණයට ඉදිරිපත් නොවීම හේතුවෙන් 2019.08.06 දින ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් විසින් විවෘත වරෙන්තුවක් නිකුත් කර ඇති බවත්;

(ii) වරෙන්තු නිකුත් කර මේ වනවිට වසරකුත් මාස දෙකක් ගතවුවද ඔවුන් අත්අඩංගුවට ගෙන නොමැති බවත්;

(iii) මේ සම්බන්ධව 2020.10.02 දින පැවති විමර්ශනයේදී ඔවුන්ට එරෙහිව පවරා ඇති නඩු 20 කට පමණ සිතාසි හා විවෘත වරෙන්තු නිකුත් කර ඇති අතර අදාළ පොලිස් ස්ථානය විසින් ඔවුන් අත්අඩංගුවට ගත යුතු බව ගාල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වෙනත් පාර්ශ්වයක බලපෑමකින් හෝ අතපසුවීමකින් ඔවුන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වී තිබේද;

(ii) එසේ නම්, එකී පාර්ශවයන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/2021

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා පුද්ගලයකු පත් කරන ලද්දේද;

(ii) එසේ නම්, එම පුද්ගලයාගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් කවරේද;

(iii) ඔහු, ස්වාධීන රූපවාහිනී සේවයේ සේවය කරන ලද කාල වකවානුව කවරේද;

(iv) ඔහුට ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් කවරේද;

(v) ඒ අනුව සේවය කරන ලද කාලය තුළ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ස්වාධීන රූපවාහිනී සේවයේ සේවය කරන ලද කාල වකවානුව තුළ ඉහත සඳහන් පුද්ගලයාට ගෙවා ඇති ගෙවීම් අයථා ගෙවීම් නම්, එම ගෙවීම්වලට වගකිව යුතු නිලධාරින්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 සැප්තැම්බර් 22 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

91/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 වර්ෂය තුළ වාර්තා වූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 සහ 2018 වර්ෂවලට සාපේක්ෂව, 2019 වර්ෂය තුළදී සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව සහ එම රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණ සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

294/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ පන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

316/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ සිට කොලොන්නාව නිමාව දක්වා ඛනිජ තෙල් ගෙන යනු ලබන නළ පද්ධතිය ඉතා පැරණි බවත්;

(ii) ඒ හේතුවෙන් විශාල ලෙස වංචා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම නළ පද්ධතිය නවීකරණය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

712/2020

ගරු මයන්ත දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංගණනය සිදු කරන ලද වර්ෂය කවරේද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ සිටින වන අලින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි-මිනිස් ගැටුම් හේතුවෙන් වාර්ෂිකව මිය යන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) වන අලින් රැක බලා ගැනීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) වන අලින් ගම් වැදීම වැළැක්වීම සඳහා අලි-වැට ඉදිකිරීම සාර්ථක ක්‍රියාමාර්ගයක් වන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා විකල්ප ක්‍රමයක් හඳුනාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

767/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කළ හැකි බෝග වර්ග ගණනාවක් ආනයනය කරනු ලබන බව එතුමා පිළිගන්නේද;

(ii) සහල්, බඩඉරිඟු, මුං, කව්පි, ඉඟුරු සහ කහ ආදියෙහි වාර්ෂික අවශ්‍යතාවය මේ වනවිට හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් බෝග ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

778/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා අහත්තිමුරිප්පු අලක්කට්ටු ගම්මානයේ පිහිටා ඇති ඉඩම වෙන් කර ඒ සඳහා වන බලපත්‍ර, එවකට අග්‍රාමාත්‍යවරයා විසින් අදාළ පවුල්වලට 2014.10.12 වන දින කිළිනොච්චියේදී ලබා දුන් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අංක NP/28/04/03/169 හා 2013.07.02 දිනැති ලිපියට අනුව, සකස් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් අතරින් මේ වනවිට බලපත්‍ර ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් බලපත්‍රලාභීන් අතරින් මේ වනවිට ඉඩම් ලැබී ඇති බලපත්‍රලාභීන් සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනතෙක් ඉඩම් ලැබී නොමැති බලපත්‍රලාභීන්ට ඉඩම් ලබා දෙන දිනය කවරේද;

(vi) ඉඩම් බලපත්‍ර ලබා දීමේදී ප්‍රමාදයන් ඇති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

932/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිරිසිදු පානීය ජලය ලබා නොදීම හේතුවෙන් වවුනියාව දිස්ත්‍රික්කයේ ජනතාව වකුගඩු රෝගයෙන් පීඩා විඳින බවත්;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති, ගම් 14කින් සමන්විත ආසික්කුලම් ග්‍රාම නිලධාරි වසමේ ජීවත්වන පවුල් 2048ක් පිරිසිදු පානීය ජලය නොමැති වීම හේතුවෙන් පීඩා විඳින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පිරිසිදු පානීය ජල පහසුකම් සහිත වවුනියාව දිස්ත්‍රික්කයේ ජීවත් වන පවුල් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ප්‍රදේශ සඳහා ජල පහසුකම් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

(iii) පාෂාණ ස්ථර සහිත භූමියකින් සමන්විත ආසික්කුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසය සඳහා කඩිනමින් පිරිසිදු පානීය ජලය ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1366/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "වේරැස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් පවතින බවත්;

(ii) එම ව්‍යාපෘතිය යටතේ නුගේගොඩ, එදිරිසිංහ පාරේ සිට කට්ටිය හන්දිය දක්වූ කොටසේ වැඩ අවසන් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කොටසේ වැඩ මේ වනතෙක් අවසන් නොකිරීමට හේතු කවරේද;

(ii) එම කොටසේ වැඩ අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1404/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පවතින දේශීය වී ප්‍රභේදවල නම්;

(ii) ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ දේශීය වී ප්‍රභේදවල නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පැරණි වී ප්‍රභේද වර්ග වගා කිරීම සඳහා පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බව දන්නේද;

(ii) පැරණි වී ප්‍රභේද වර්ග සංරක්ෂණය කිරීමට සහ වගා කිරීමට ගෙන ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වනවිට ශ්‍රී ලංකාවේ වකුගඩු හා පිළිකා රෝග බහුලව පවතින බවත් එතුමා දන්නෙහිද?

(ඈ) ජාන විකෘති කර නිෂ්පාදිත, ශ්‍රී ලංකාවට ආවේනික නොවූ වී සහ බීජ වර්ගවලින් නිෂ්පාදන කරන ලද ආහාර භාවිතා කිරීම ප්‍රධාන වශයෙන් මෙයට හේතු වී ඇති බව පර්යේෂණ මඟින් තහවුරු වී තිබේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1669/2021

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉතාලියේ, මිලාන් නගරයේ පිහිටි කොන්සල් ජනරාල් කාර්යාලය සඳහා මේ වනවිට කොන්සල් ජනරාල්වරයෙකු පත් කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මිලාන් නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් කොන්සල් ජනරාල් කාර්යාලය සඳහා කොන්සල් ජනරාල්වරයෙකු පත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 සැප්තැම්බර් 23 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

295/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ විනිමය ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

439/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත් වන දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ හා වෙනත් ආයතනයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානයේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද?

(iv) ඉහත ආයතන අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන ආයතනවල නම් කවරේද;

(v) එම ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන මාසික කුලිය කොපමණද;

(vi) ඉහත අමාත්‍යාංශයට අයත් වන සියලු ආයතන රජයේ ගොඩනැගිලි තුළ ස්ථාපනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

469/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයට අදාළව පර්යේෂණ හා නවෝත්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල, එම වර්ෂයේ සමස්ත අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස;

(iii) ඉහත සඳහන් එක් එක් වර්ෂයේ ලියාපදිංචි කරන ලද නවෝත්පාදන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමේදී අනුගමනය කල යුතු ක්‍රමවේදය කවරේද;

(ii) නවෝත්පාදන සිදුකරනු ලබන පර්යේෂකයන් මුහුණ දෙනු ලබන මූල්‍ය දුෂ්කරතා අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

673/2020

ගරු හේෂා විතානගේ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරුවන් ලෙස කටයුතු කළ එක් එක් පුද්ගලයාගේ නම සහ ඔහු සේවය කරන ලද කාල සීමාව කවරේද;

(ii) එම එක් එක් පුහුණුකරුවාට ගෙවන ලද වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(iii) එම එක් එක් පුහුණුකරුවා යටතේ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම ලැබූ ටෙස්ට් හා එක්දින ජාත්‍යන්තර තරග ජය හා පරාජයන් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායම සඳහා පුහුණුකරුවකු තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

833/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී මත්පැන් නිෂ්පාදනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එම නිෂ්පාදනාගාර පවත්වා ගෙන යනු ලබන ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් මත්පැන් නිෂ්පාදනාගාර අතරින් 2015 වර්ෂයෙන් පසුව වසා දමන ලද මත්පැන් නිෂ්පාදනාගාර තිබේද;

(ii) එසේ නම්, එම නිෂ්පාදනාගාරවල නම් කවරේද;

(iii) එසේ වසා දමන ලද නිෂ්පාදනාගාරවල මත්පැන් නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

840/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කය, අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන බවත්;

(ii) අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය තුළින් වැඩි වශයෙන් ආයෝජන අවස්ථා ලබා ගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා කිහිපයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) ඉහත අ(ii)හි සඳහන් ආයෝජන අවස්ථා සෘජුවම කර්මාන්තයේ නියැලෙන්නන්ට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1086/2020

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්ගේ කාර්යාලය (UNHCR) හරහා පාකිස්ථානයේ හා ඇෆ්ගනිස්ථානයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති සරණාගතයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම සරණාගතයන් රඳවා සිටිනු ලබන ස්ථාන කවරේද;

(iii) එම සරණාගතයන්ට ලබා දෙනු ලබන පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෙනත් රටවල සරණාගතයන් භාරගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථිකයට අහිතකර බලපෑමක් ඇති වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1440/2021

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ ඇති එක් එක් ඩිපෝවේ —

(i) සේවක සංඛ්‍යාව;

(ii) ධාවනය කරනු ලබන දුර ගමන් බස් රථ හා කෙටි ගමන් බස් රථ සංඛ්‍යාව;

(iii) වර්ෂ 2015 සිට 2020 දක්වා ආදායම එක් එක් වර්ෂය අනුව ;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ උප ඩිපෝ තිබේද;

(ii) දියසෙන්පුර උප ඩිපෝව ප්‍රධාන ඩිපෝවක් ලෙස උසස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1647/2021

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව පැතිරෙමින් පවතින ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා මේ වනවිට ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1734/2021

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015-2019 කාලය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ මෝටර් රථ ධාවන ශූරයෙකු, ඔහු විසින්ම මුදල් ගෙවා ස්වාධීන රූපවාහිනිය මඟින් විකාශය කරන ලද වැඩසටහනේ නම කවරේද;

(ii) පසුව එම වැඩසටහන් මාලාව වෙනුවෙන් ස්වාධීන රූපවාහිනී සේවය මඟින් ඉහත සඳහන් පුද්ගලයාට මුදල් ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම එක් වැඩසටහනක් වෙනුවෙන් සහ සියලු වැඩසටහන් වෙනුවෙන් එම පුද්ගලයාට ගෙවන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාලය තුළ "අනෝමාස් කිචන්" නැමැති වැඩසටහන, ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීම වෙනුවෙන් මුදල් ගෙවා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) (i) සහ (ආ) (i) හි සඳහන් කරන ලද වැඩසටහන් දෙක සඳහා මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම මුදල, ඉහත නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 සැප්තැම්බර් 24 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

177/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

324/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික මීවන විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති මීවන විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික මීවන විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික මීවන පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික මීවන ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

569/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නැව්වලින් ගෙන එනු ලබන ඛනිජ තෙල් ගොඩබෑමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් වර්ෂ 2015 සිට 2020 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම නැව් සමාගම්වලට ගෙවන ලද ප්‍රමාද ගාස්තු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාද ගාස්තු ගෙවීමට හේතු වූ කරුණු කවරේද;

(iii) ශ්‍රී ලංකාවට නැව්වලින් ගෙන එනු ලබන ඛනිජ තෙල් ගොඩබෑමේදී සිදුවන ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

674/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති පළාත් පාලන ආයතන කවරේද;

(ii) වර්ෂ 2010 සිට එම එක් එක් පළාත් පාලන ආයතනය සඳහා සබරගමුව පළාත් සභාවෙන් අය විය යුතු මුද්දර ගාස්තුවල වටිනාකම කොපමණද;

(iii) එම මුද්දර ගාස්තුවල වටිනාකම අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

768/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගය ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය මාර්ගයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ පළමු අදියරේ සහ දෙවන අදියරේ වැඩ අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, එම එක් එක් අදියරේ වැඩ අවසන් කරනු ලබන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iv) එම මාර්ගයේ තෙවන අදියරේ වැඩ කටයුතු සඳහා මුදල් වෙන් කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

793/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන මුළු පාසල් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ගුරු-සිසු අනුපාතය කොපමණද;

(iv) ගුරු තුලනයක් ඇතිවන පරිදි ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

907/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර, තලාව නගරයේ බස් නැවතුම්පළෙහි ගොඩනැගිලි ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) වැසි දිනවලදී එම බස් නැවතුම්පළ මගී ජනතාවට භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම බස් නැවතුම්පළ අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1405/2021

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) රජය විසින් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව;

(ii) රජය විසින් ඉදිකරන ලද එක් එක් නිවස ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

(iii) ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති (උදාගම්) සංඛ්‍යාව;

(iv) ඉදිකරන ලද එක් එක් උදාගම විවෘත කිරීමේ උත්සවය සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2019 දක්වා —

(i) ඉදිකර ජනතා අයිතියට පත් කරන ලද නිවාස ව්‍යාපෘතිවල සමරු ඵලක වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බෙදා දෙන ලද සිමෙන්ති කොට්ට සංඛ්‍යාව කොපමණද;

(iii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බෙදා දුන් සිමෙන්ති කොට්ට බෙදා දෙන ලද පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1422/2021

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය විසින් 2017 ඔක්තෝබර් මාසයේදී සියලුම පාසල් සිසුන් සඳහා හඳුන්වා දෙන ලද 'සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය' වර්තමාන රජය විසින් 2020 වර්ෂයේදී නැවතත් ක්‍රියාත්මක කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම ආරම්භ වන දිනය කවරේද;

(ii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යම් කාල පරිච්ඡේදයක් පුරා ක්‍රියාත්මක නොවී පැවතියේද;

(iii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ආරම්භයේ සිට පිරිනමන ලද එක් එක් කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් සමාගම සහ කොන්ත්‍රාත්තුව වලංගු වන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් කොන්ත්‍රාත්තුව ලබා දුන් ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද; සහ

(v) පිරිනමන ලද එක් එක් කොන්ත්‍රාත්තුවෙහි වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2020 වර්ෂයේදී පිරිනමන ලද 'සුරක්ෂා ශිෂ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය' මගින් ආවරණය වන සිද්ධීන්ට අදාළව යම් ප්‍රධාන වෙනස්කම් කිසිවක් සිදු වී තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

1623/2021

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලපත්ගම ග්‍රාමය කේන්ද්‍රකර ගනිමින් "පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි ගම" නමින් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන සඳහා මුදල් වෙන් කරන ලද ප්‍රභවය කවරේද;

(ii) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල් වියදම් කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) එම මුදල් වියදම් කරන ලද ආකාරය කවරේද;

(iv) මේ වනවිට එම වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මේ වනවිට අතරමග නවතා දමා ඇති ඉහත වැඩසටහනේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?